# මැතිවරණය හා ජාතිකත්වය

මෙවර මැතිවරණයේ දී එක්සත් ජාතික පක්ෂය, පැරණි මාක්ස්වාදී පක්ෂ හා දෙමළ ජාතිවාදී පක්ෂ හැරුණුකොට අනෙක් පක්ෂ බොහෝමයක් ජාතිකත්වය දෙසට තල්ලු වී ඇත. ඒ තල්ලු වීම ව්‍යාජ ද නැත් ද යන්න පිළිබඳ ව මතභේද ඇත. අවස්ථාවාදී ව තම මතය වෙනස්කර ගත්තෝ ද ඒ අතර වෙති. මෑතක් වන තුරුම මෙරට බෞද්ධ රාජ්‍යයක් විය යුතු යැයි කියා සිටි එකම දේශපාලන පක්ෂය භූමිපුත්‍ර පක්ෂය විය. දැනට මාස දෙකකට කලින් පවා සිංහල බෞද්ධයන් ගැන කතාකිරීම ප්‍රතික්ෂෙප කළ පක්ෂයක් අද ධර්ම රාජ්‍යයක් පිහිටු වීම සඳහා තම පක්ෂය පූජා කර ඇත. එහෙත් එහි නිලතල උසුලන්නෝ ගිහියෝ ය. පක්ෂය තුළ පිහිටුවා ගනු ලැබ ඇති ඊනියා උත්තරීතර මණ්ඩල, මැතිවරණ කොමසාරිස්වරයා ගේ පැත්තෙන් ගත්කල, වැදගත්කමක් ඇති දෑ නෙවෙයි. ඔහුට වැදගත්වන්නේ නිල වශයෙන් ලියා පදිංචි වී ඇති පක්ෂය කුමක් ද යන්නත් එහි නිලධාරීන් කවුරුන් ද යන්නත් ය.

එක්සත් ජනතා නිදහස් සංධානයේ ප්‍රතිපත්ති ද ජාතිකත්වය දෙසට යොමු වී ඇත. අප බොහෝ අවස්ථාවල කියා ඇත්තේ 1994 පොදු පෙරමුණට වඩා 2004 එක්සත් ජනතා නිදහස් සංධානය වෙනස් බව ය. එදා කුමාරතුංග මහත්මිය යනු කිසිවකු විසින්වත් නොදැනසිටි කාන්තාවක යැයි ජාතිකත්වය ගසාකන එක්තරා දේශපාලන පක්ෂයක අවස්ථාවාදය තම එකම ප්‍රතිපත්තිය කරගත් නායකයකු කියා තිබෙනු දැකගත හැකි විය. මේ පට්ටපල් බොරුවකි. 1994 වන විට පොදු ජන එක්සත් පෙරමුණ මුළුමනින් ම විජාතික බලවේගවල ග්‍රහණයට හසු වී සිටියේ ය. විජාතික බලවේග කුමාරතුංග මහත්මිය එංගලන්තයේ සිට ගෙන ආවේ ඈ ලවා හැකිනම් සන්ධීය රාජ්‍යයක් දෙමළ ජාතිවාදයට ලබා දීමට ය. ඒ බව අපි ඒ දිනවල ම තේරුම්ගෙන සිටියෙමු. අපි ඒ බව එදා ප්‍රශ්නොත්තර මගින් හා ලිපිවලින් ජනතාවට කියා දුන්නෙමු. අවස්ථාවාදීන්  ඒ බව නොදැන සිටියා නොවේ. ඔවුන් දැන් වෙනත් දෙයක් කියන්නේ, එනම් එකල තමන් කුමාරතුංග මහත්මිය යනු කවුදැයි නොදැන සිටි බව කියන්නේ ජනතාව රැවටීමට ය.

සිංහල ජාතිකත්ව මත දරණ ඇතැමුන්ට දේශපාලන බල තුලනයේ වෙනස්වීම නොතේරීම කණගාටුදායක ය. අවුරුදු දහයක් තිස්සේ මේ බල තුලනය ක්‍රමයෙන් වෙනස් වී ඇත. විජාතිකත්වයේ සිට ජාතිකත්වයට ඇති වු මේ වෙනස අහම්බෙන් ඇති වුවක් නොවෙයි. අප කලින් ද සඳහන්කර ඇති ආකාරයට 1994 යනු ජාතිකත්වය සම්බන්ධයෙන් ගත්කල නරක ම වසර විය. කලක් තිස්සේ, විශේෂයෙන් ම 1977 න් පසුව කෙරීගෙන ගිය සිද්ධීන් හේතුකොටගෙන 1994 උදා විය. 1977 න් පසු මෙරට සිදු වූයේ ලංකාවට පමණක් සීමා වූ කාර්යයක් නොවේ. පෞද්ගලිකකරණය මුළු ලොව පුරාම ක්‍රියාත්මක වෙයි. බ්‍රිතාන්‍යයේ ද බ්‍රිටිෂ් රේල්වේස් වැනි පැරණි රාජ්‍ය ආයතන පවා පෞද්ගලිකකරණය සඳහා පියවර ගැණිනි. මේ ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනය විකාශය වීමේ ප්‍රතිඵලයකි. සමස්තය වෙනුවට පුද්ගලිකත්වය, සංස්ලේෂණය වෙනුවට විශ්ලේෂණය, සංයුක්තය වෙනුවට වියුක්තය ආදිය මේ චින්තනයේ ගුණ (අගුණ) වෙයි. මේ චින්තනය විසින් පුද්ගලයන් ලෙස ගත්කල මිනිසා සංස්කෘතියෙන් ඈත්කර ප්‍රකෘතිය කරා ගෙන යනු ලැබේ. ඉන්ද්‍රිය පිනවීමට ඉඩ දීම යනු මිනිසාගේ ප්‍රකෘතිය වෙත යෑමකි. ඒ අතර පරිසරය පැත්තෙන් ගත්කල ඒ චින්තනය එහි විරුද්ධයට අනුබල දෙයි. එනම් මිනිසා ප්‍රකෘතියෙන් වෙන් කර මිනිසා නිර්මාණය කරන ලෝකයකට කැඳවාගෙන යෑම ය.

මිනිසුන්ට සංස්කෘතියක් අවශ්‍ය වන්නේ ප්‍රධාන වශයෙන් ම මිනිසා ඉව නැතිකරගත් හෝ අවම කරගත් සතකු වීමත් මිනිසාට බුද්ධියක් තිබීමත් හේතුකොටගෙන ය. ප්‍රකෘතියෙන් ම මිනිසාට ඉන්ද්‍රිය පිනවීම අවශ්‍ය වෙයි. ඒ මිනිසාගේ පැවැත්මට අහිතකර ය. අනෙක් සතුන්ට වඩා අඩු ඉවක් ඇති හෙයින් ද මිනිසා ස්වාභාවික ව ක්‍රියා කරන්නේ පැවැත්මට විරුද්ධව ය. මිනිසාට බුද්ධියක් ඇති බැවින් පැවැත්මට විරුද්ධ ඒ ක්‍රියාවලින් සීමාකිරීම මෙන් ම බුද්ධිය නිසා ම පරිසරය හැසිරවීමට, වෙනස්කිරීමට, මිනිසාට ඇති හැකියාව යහමගට යොමු කිරීම ද අරමුනු කරමින් මිනිස් ක්‍රියාකාරකම්වලට තහංචි පැනවීමට  අවස්ථාව උදා වී ඇත. සංස්කෘතීන් නිර්මාණය වන්නේ කළ යුත්තේ හා නොකළ යුත්තේ කවරේදැයි මිනිසා එලෙස සම්මතයකට එළඹීමට කටයුතු කිරීම හේතුවෙන් ය. පහළොස්වැනි සියවසේ නූතනත්වය සමග බිහි වූ වත්මන් බටහිර යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතිය අද ඇමරිකාවේ නායකත්වය යටතේ මිනිසා සංස්කෘතියෙන් ඈත්කිරීමට කටයුතු කරයි. මෙහි මුල් ඇත්තේ ඒ සියවසේ පමණ බිහි වූ ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනයෙහි ය.

© Prof. Nalin De Silva

මතුපිටින් ගත්කල එක එකක් අනෙකෙන් වෙන් කිරීම මේ චින්තනයේ තවත් ලක්ෂණයකි. කලාව විද්‍යාවෙන් වෙන් කෙරුණේ ද, සාහිත්‍ය ඉතිහාසයෙන් වෙන් කෙරුණේ ද, නවකතාව අනෙක් කලාවෙන් වෙන් කෙරුණේ ද, අද නව කතාව සමාජ විශ්ලේෂණයෙන් හා මනෝ විශ්ලේෂණයෙන් වෙන් කෙරෙන්නේ ද මේ චින්තනයේ ප්‍රතිඵලයක් ලෙසිනි. මේ චින්තනය පදනම් කරගෙන බිහි වී ඇති ඇංකරයන්ට මහාවංශය ඉතිහාස ග්‍රන්ථයක් ද යන ප්‍රශ්නය පැන නගින්නේ ඔවුන් ඉතිහාසය සාහිත්‍යයෙන් හා සාහිත්‍යය බණ කතාවෙන් වෙන් කර ඇති බැවිනි. මහාවංශයෙහි ඉතිහාසය ද, සාහිත්‍යය ද බණ කතා ද වෙයි. ඒ අපේ වෙන් නොකරන සම්ප්‍රදාය මත පදනම් වී රචිත කෘතියකි. පියදාස සිරිසේන මහතාගේ කෘති ප්‍රචාරාත්මක කෘති යනුවෙන් හඳුන්වනු ලැබුවේ ද  මේ චින්තනය ගුරු කොට ගත්තවුන් විසිනි. බටහිර නවකතාව එවකට බටහිර තිබූ අයුරින් හඳුන්වා දුන් මාර්ටින් වික්‍රමසිංහ මහතා වුව ද මේ චින්තනය ගුරුකොට ගත්තේ ය. බටහිර නවකතාව ද ප්‍රචාරාත්මක කෘතියක් වෙයි. එය බටහිර මතවාද ප්‍රචාරය කරයි. එහෙත් ඒ බව බටහිරයෝ සඟවති. ජාතක කතාව බටහිර කෙටිකතාව වැනි යැයි කීම බටහිර සංස්කෘතික යටත්විජිතවාදය ඉදිරියේ වැඳ වැටී අපට ද ඔවුන්ගේ දේ පෙර තිබුණා කියා සතුටු වීමට දරණ බෙළඳ වෑයමක් පමණකි. බුදුන් වහන්සේ ඊනියා ආනුභාවිකවාදියකු (එම්පිරිසිස්ට්) හෝ ප්‍රපංචවේදියකු (ෆිනොමිනොලොජිස්ට්) හෝ බවට පත් කිරීමට දරණ වෑයම ද බටහිර සංස්කෘතික යටත්විජිතවාදයේ ප්‍රතිඵලයකි. බුදුන් වහන්සේගේ ප්‍රත්‍යක්ෂය යනු බටහිර විද්‍යාඥයන්ගේ හා අන් අයගේ ප්‍රපංච නොවේ. මෙරට පශ්චාත්නූතනවාදීන් යැයි කියන්නන් ක්‍රියාකරන ආකාරය නොවන්නට ඇතැමකු අතින් බුදුන් වහන්සේ පශ්චාත්නූතනවාදියකු කරනු ලැබීමට ද ඉඩ තිබුණි. අද වැඩි වශයෙන් ලිවිය යුත්තේ ඊනියා ඉන්ද්‍රජාලික හෝ නොවන හෝ  යථාර්ථයක් ගැන කියන නවකතා නොව අපේ සම්ප්‍රදායේ බණ කතා ද මුසු කරගත් කතා ය.

ලංකාවේ පමණක් නොව ලෝකයේ ම බටහිරයෝ තමන්ට අවශ්‍ය නිවටයන් බිහිකර ගනිති. රාජ්‍ය නොවන සංවිධාන යනු අවසාන වශයෙන් ගත්කල බටහිර සංස්කෘතිය දේශපාලනය හා ආර්ථිකය ප්‍රචලිත කිරීම සඳහා ඒ පිළිබඳ ජනමතයක් ඇති කිරීම සඳහා බටහිරයන් තනාගෙන ඇති ආයතන ය. ඒ හරහා බටහිරයෝ රාජ්‍යයට අමතර ව රාජ්‍ය විරෝධී ජනමතය ද හසුරවති. අද ආසියාතික හා වෙනත් සංස්කෘතීන් ඒ ඒ රටවල ජනතාවට එපාකරවීම සඳහා ඊනියා ප්‍රබුද්ධයන් යැයි ගැනෙන පුද්ගලයන් පිරිසක් බිහි කෙරී ඇත. ලංකාවේ මේ පුස්සන් ඉන්නේ දේශීය මට්ටමකින් පමණකි. එහෙත් ලෝක මට්ටමෙන් ම ක්‍රියාත්මක වන එවැනි පුස්සෝ වෙති. අරුන්දතී රෝයි, සාමන් රුෂ්ඩි, බංගලා දේශයේ ලජ්ජා නැති ගැහැණිය වූ තස්ලිමා නස්රින් ආදීහු බටහිර සංස්කෘතික යටත්විජිතවාදයට සේවය කරන සාක් කලාපයේ බිහි වූ ලෝක මට්ටමේ පුස්සෝ වෙති. අපට අද අභිමානයෙන් කිව හැක්කේ අවුරුදු දහඅටක ව්‍යායාමයක ප්‍රතිඵලයක් ලෙස මේ ලෝක ප්‍රවණතා හැඳින ගැනීම සඳහා ප්‍රවාද, ලෝකයේ වෙනත් කවරකුටවත් වඩා අප සතුව පවතින බව ය.

බටහිර යටත්විජිතවාදයෙන් මිදීම මූලික වශයෙන් ගත්කල බටහිර සංස්කෘතික යටත්විජිතවාදයෙන් මිදීමකි. බටහිර නූතනත්වයෙහි ම ප්‍රතිඵලයක් වූ බටහිර ක්‍රිස්තියානි යටත්විජිතවාදයේ භයානක ම අංගය වනුයේ බටහිර ක්‍රිස්තියානි සංස්කෘතික යටත්විජිතවාදය ය. බටහිර දැනුම අප මත පටවන්නේ මේ සංස්කෘතික යටත්විජිතවාදයෙහි කොටසක් ලෙස ය. පෘතුගීසීන් පැමිණි දින සිට සිංහල බෞද්ධ සංස්කෘතිය නැති කිරීමට බටහිරයන් ක්‍රියාකර ඇත. වෙහෙර විහාර කැඩීම, බෞද්ධයන් අබෞද්ධයන් බවට හෝ ඒ බැරි නම් නරක බෞද්ධයන් බවට හෝ පත්කිරීම ආදිය පමණක් නොව බටහිර දැනුම් ආධිපත්‍යය පැටවීම ද සංස්කෘතික යටත්විජිතවාදයෙහි අංග වෙයි. 1977 - 1994 කාලයෙහි මේ ක්‍රියා උත්සන්න විය. එක්තරා ආකාරයකින් ගතහොත් ජාතික චින්තන මතවාද 1986 දී පමණ ඇරඹී වර්ධනය වූයේ මේ ක්‍රියාදාමයට එල්ල කළ අභියෝගයක් ලෙස ය.

කෙසේ හෝ 1994න් පසුව සමස්ත දේශපාලනය ම ජාතිකත්වය දෙසට නැවතත් තල්ලු වීම ආරම්භ විය. සෝම හිමියන් ද ජාතික ව්‍යාපාරයට එක් වූයේ ඉන් පසුව ය. මුල දී බුද්ධිවාදියකු වූ උන්වහන්සේ ක්‍රමයෙන් ජාතිකත්වය දෙසට නැඹුරු වූහ. උන්වහන්සේ අපවත් වීමෙන් පසුව අවිඥානික ජාතිකත්වය මතුපිටට පැමිණීම වැරදි ලෙස අවබෝධ කරගත් ඇතැම්හු ජාතිකත්වය ගසාගෙන කෑමට උත්සාහ කරති. ඒ උත්සාහය ඔස්සේ ඔවුහු විජාතික බලවේගවල ගොදුරක් බවට පත්ව සිටිති. ජාතිකත්වය ගසා කෑමට උත්සාහ දරන්නන් මෙහෙයවීමට විජාතික බලවේගවලට හැකි බව අමතක නොකළ යුතු ය.

© Prof. Nalin De Silva

අද චන්ද්‍රිකා කුමාරතුංග මහත්මියට අකමැත්තෙන් වුව ද ජාතිකත්වයේ බලවේගවලට නායකත්වය දීමට සිදු වී ඇත. ඉන් අදහස් කරන්නේ ඇය ජාතිකත්වය වැළඳගෙන ඇති බවක් නොවෙයි. ජනතා විමුක්ති පෙරමුණට ද අද ජාතිකත්වයෙන් ඉවත්වීමට නොහැකි ය. අනෙක් පැත්තෙන් මෙරට දෙමළ ජාතිවාදයේ ප්‍රභාකරන්ට එල්ල වූ ප්‍රබල ම අභියෝගය අද කරුණාගෙන් එල්ල වී ඇත. කරුණා පසුපස ඉන්දියාව ඇතත් නැතත් මේ අභියෝගය ප්‍රභාකරන්ට පමණක් නොව බටහිර ක්‍රිස්තියානි යටත්විජිතවාදයට ම එල්ල වූවකි. මේ සියල්ල බුද්ධිමත් ව හැසිරවීමට මෙරට ජාතිකත්වයේ බලවේගවලට හැකිවිය යුතු ය.

කරුණාට මෙන් ම එක්සත් ජනතා නිදහස් සංධානයට ද ඊනියා නිජබිම් සංකල්පය අත්හැර දැමීමට සිදු වෙයි. ඉන්දු ලංකා ගිවිසුමට අද පදනමක් නැත. එහි ආරම්භයෙහි ම කියැවෙන්නක් නම් උතුරු හා නැගෙනහිර පළාත් එක් ඒකකයක් ලෙස මෙරට දෙමළ ජනතාවගේ සාම්ප්‍රදායික වාසභූමි බව ය. මෙරට ජනාධිපතිවරුන් නොකළ ද කරුණා උතුරු හා නැගෙනහිර පළාත් වෙන්කර ඇත. තොණ්ඩමන්ට දැන් කඳුකරයේ දෙමළ ජනයා ප්‍රභාකරන්ගේ ආධිපත්‍යයට බිලි දීමට අවශ්‍ය නොවෙයි. තවදුරටත් මෙරට දෙමළ ජාතියක් ඇතැයි කොළඹ විශ්ව විද්‍යලයේ දේශපාලන විද්‍යාව උගන්වන මන්දබුද්ධිකයකුට වුව ද කීමට සිදුවන්නේ තම බුද්ධිය පිළිබඳ ව හෙළිදරවුවක් ද කරමින් ය. ප්‍රභාකරන් තව දුරටත් දෙමළ ජනතාවගේ එකම නියෝජිතයා නොවෙයි. අද සාකච්ඡා කිරීමට සිදුවන්නේ බලය බෙදීමක් ගැන හෝ සහසන්ධීය රාජ්‍යයක් බිහි කිරීම ගැන හෝ නොවෙයි. කරුණා යම් හෙයකින් බටහිරයන් විසින් පරාජය කරනු ලැබුව ද මේ තත්ත්වය ආපසු හැරවිය නො හැකි ය. ප්‍රභාකරන්ට කරුණා පැරදවිය නොහැකි ය. ප්‍රභාකරන් යනු බටහිරයන් විසින් පුම්බනු ලැබුවකු මිස යුද්ධ දක්ෂයෙක් නොවෙයි. ඔහු ක්‍රිස්තියානි යටත්විජිතවාදය විසින් හසුරුවනු ලැබූ නිවටයෙකි. විජාතික බලවේග බලයෙන් පවත්වාගෙන ගිය මායාවේ කඩතුරාව ඉරා දමනු ලැබ ඇත. මෙයින් කියැවෙන්නේ කරුණා ගැන අප බලාපොරොත්තු තබාගත යුතු ය යන්න නොවන බව ද අවධාරණය කළ යුතු ය.

අප තීරණ ගත යුත්තේ දේශපාලන පක්ෂවල බොරු මැතිවරණ ප්‍රකාශ කියවා නොව දේශපාලනයේ ගතිකය තේරුම් ගැනීමෙන් පසුව ය. විවිධ බලවේග ක්‍රියාකරන්නේ කෙසේ ද කාගේ වුවමනාවට ද යන්න අප තේරුම්ගත යුතු ය. බටහිර ක්‍රිස්තියානි යටත්විජිතවාදයට විරුද්ධ නොවන ජාතිකත්වයක් තිබිය නොහැකි ය. එමෙන් ම බටහිර යටත්විජිතවාදයට විරුද්ධ වූ පමණින් ම ජාතිකත්වයට පැමිණෙන්නේ ද නැත. බටහිර යටත්විජිතවාදය සංස්කෘතික යටත්විජතවාදයක් ද බව අවබෝධ කර නොගන්නා පුද්ගලයා අවසානයේ දී ලිබරල්වාදියකු හෝ මාක්ස්වාදියකු හෝ වෙනත් වාදියකු වී බටහිර ක්‍රිස්තියානි යටත්විජිතවාදයට ම සේවය කරයි. එමෙන් ම ජාතිකත්වය ගසාකමින් බලයට පත්වීමට වෑයම් කරන්නන් අතින් සිදුවන්නේ ද ජාතිකත්වය පරාජය කිරීමට විජාතික බලවේගවලට රුකුල් දීමකි. මැතිවරණයේ දී අපි මේ සියල්ල සලකා බලමු. නායක නායිකාවන් ගේ කතා මොනවා වුව ද ජාතිකත්වයට එයට හිමි ගමන් මගක් ඇත. ජාතිකත්වයට ජයග්‍රහණය කිරීමට ඇත්තේ මැතිවරණයේ දී පමණක් නොවන බව අමතක නොකළ යුතු ය. එහෙත් ඒ සියළු ජයග්‍රහණ සඳහා මැතිවරණ ජයග්‍රහණය පූර්ව කොන්දේසියක් වෙයි.

© Prof. Nalin De Silva